# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2079/75 – 2018 ජූලි 13 වැනි සිකුරාදා – 2018.07.13**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/COM/02/2016/162.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්*

කේ. පියතිලක මයා, අංක 199, තක්ෂිලා උයන, මූනගම, හොරණ

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මාතලේ, මේල්පිටිය, අංක 75, එස්. කාරියවසම් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජූලි මස 09 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2016/162.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්*

කේ. පියතිලක මයා, අංක 199, තක්ෂිලා උයන, මූනගම, හොරණ

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

"කේ. පියතිලක මහතා රාජ්‍ය මැණික් සංස්ථාවේ කණිෂ්ඨ ලිපිකරුවෙකු ලෙස සේවයට බැඳී ජ්‍යෙෂ්ඨ ලිපිකරු සහ වැඩබලන ව්‍යාපෘති නිලධාරී ලෙස උසස්වීම් ලැබ සිටි අවස්ථාවක දී රාජ්‍ය මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට, එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත අන්තර්ග්‍රහණය වී අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසුව විශ්‍රාම යාමට ඉල්ලීමක් කර මාසයක් අවසන් වීමට පෙර එම ඉල්ලීම ඉවත් කර ගන්නා බවට අධිකාරියට දන්වා තිබිය දී එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර සේවය අවසන් කිරීමෙන් අසාධාරණයක් සිදු වී ඇත් ද? යන්න හා එසේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ."

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජූලි මස 04 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 948

---

මගේ අංකය: IR/COM/01/2017/191.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්*

නන්දසිරි ලොකුකළුගේ මයා, අංක 269/2 ඒ, ආරියසිංහල මාවත, කොස්වත්ත පාර, කලපළුවාව, රාජගිරිය

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී, ලෝටස් පාර, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 128, එස්. විරිතමුල්ල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජූලි මස 09 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය*: IR/COM/01/2017/191.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්*

නන්දසිරි ලොකුකළුගේ මයා, අංක 269/2 ඒ, ආරියසිංහල මාවත, කොස්වත්ත පාර, කලපළුවාව, රාජගිරිය

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී, ලෝටස් පාර, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය** වනුයේ,

"ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී හි ජ්‍යෙෂ්ඨ විධායක සහකාර කළමනාකරු ලෙස සේවය කළ නන්දසිරි ලොකුකළුගේ මහතා වෙත අවුරුදු 60 දක්වා සේවය කිරීමට සේවා දිගුවක් ලබා නොදී ඔහුට වයස අවුරුදු 55 සම්පූර්ණ වූ 2017.01.04 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම ගැන්වීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න සහ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ."

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජූලි මස 04 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 949